**පැලියගොඩ නගර සභාව - 2022**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර මතය**

පැලියගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.15,009,543ක් හා රු.984,138 ක් වශයෙන් ලැබී තිබුණු රු. 15,993,681 ක්වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන පරිච්ඡේද අංක 9.9 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 10 යටතේ 2022 ජනවාරි 01 දිනට දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඊට අදාල ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත වූ වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ලෙස වර්ෂයේ විස්තීර්ණ ආදායමට මාරු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ප්‍රමිතයට අනුකූලව සටහන් අංක 5 සහ 10 නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) පරිච්ඡේද අංක 9.9 ප්‍රකාර හා පළාත් පාලන ආයතන ප්‍රමිත උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 2.7 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.1,748,189ක ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් රු.1,311,142 ක් වර්ෂයේ වියදම් කළ ප්‍රමාණය ලෙස හඳුනාගෙන පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් වශයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයභාරයක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් මෙය නිවැරදි කිරීමටත් ඉදිරියට නිවැරදිව ගිණුම් තැබීමටත් කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.7,780,894 ක ලී බඩු හා උපකරණ ශේෂය තුල ඉකුත් වර්ෂයේ දෙවරක් සටහන් වී තිබූ රු.322,609 ක් ද වටිනාකම වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අත් කරත්ත 8 ක වූ රු.940,800 ක් ද නිවැරදි කර නොතිබුණු බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ලී බඩු හා කාර්යාල උපකරණ ශේෂය රු.1,263,409 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් නිවැරිදි කිරීමට කටයුතු කරන බව . | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය කළ රු.645,200,000ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.18,445,000 ක් වූ පාරවල් හා පාලම් ශේෂය රු.19,445,000ක් ලෙස රු.1,000,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ප්‍රාග්ධනිත කර තිබුණු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.1,765,840 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ රක්ෂණය කරනු ලබන රක්ෂණ සමාගමේ තක්සේරුව පදනම් කරගෙන ක්ෂය ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.3,044,295 ක් වූ මෝටර් රථ ක්ෂය වියදමක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේ මෝටර් රථ වාහනවල වෙළඳපොල වටිනාකම ඉතාමත් සීග්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් නව ප්‍රත්‍යාගණනයක් සිදු කරන ලදී. වඩාත් සාධාරණ වර්ථමාන පොත් අගය මෝටර් රථ ගිණුමට ගැනීමට කටයුතු කළ බව. | -එම- |
| (ඊ) | 2018 සිට 2022 දෙසැම්බර් දක්වා මිලදී ගෙන තිබූ රු.1,058,400ක්වූ අත් කරත්ත 9 ක වටිනාකම හා රු.60,000 ක් වූ බයිසිකලයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (උ) | ණයහිමි අධි වෙන්කිරීම් රු.484,626 ක හා අත්හිටුවන ලද ව්‍යාපෘති කාර්යයන් රු.3,858,836 ක එකතුව රු.4,343,462 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.3,919,093 ක් වටිනා ස්ථාවර වත්කම් අදාල වත්කම් ගිණුම්වලට හර කිරීමට අතිරේකව වර්ෂයේ වියදමට හර කර සංචිත හා වෙන් කිරීම් ගිණුම බැර කර තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ විනෝද බදු ආදායම රු.38,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට විනෝද බදු වෙනම ගිණුමක් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඒ) | ස්ථාවර තැන්පතු 2ක් වෙනුවෙන් ඉකුත් වර්ෂයට අදාල රු.279,970ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායමක් ලෙස ද සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු 11 කට අදාල රු.217,096ක පොලී ආදායමක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | |
|---|---|---|
| (ඔ) සමාලෝචිත වර්ෂයේ රු.3,118,091 ක් වූ කසල බදු ආදායම රු.2,709,167 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා කසල බදු ආදායම රු.408,924 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර ලැබියයුතු කසල අපහරණ ගාස්තු රු.915,048 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඕ) සමාලෝචිත වර්ෂයට අදාල යන්ත්‍ර ක්ෂය රු.775,238ක් වියයුතු වුවත් රු.1,033,351ක් ලෙස ගණනය කර තිබුණු හෙයින් යන්ත්‍ර ක්ෂය රු.258,113ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදි නිවැරදි කර ඉදිරිපත් කරන බව. | -එම- |
| (ක) සමුච්චිත අරමුදලට ගැලපිය යුතු සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වූ රු.33,099,357 ක් රු.31,788,215 ක් ලෙස රු.1,311,142 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 07 ක ශේෂ එකතුව රු.70,502,638 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.45,183,540 ක් වූයෙන් 25,319,098 ක වෙනසක් විය. | ඉදිරි ගිණුම් වර්ෂයේදි මෙම වැරදි නිවැරදි කර වඩාත් නිවැරදි ගිණුම් වාර්ථාවක් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ලෙජරයේ විවිධ ණයගැති ගිණුමේ ශේෂය රු.19,883,414 ක් වුවද උපලේඛන අනුව ශේෂය රු.18,490,543 ක් ලෙස ඉදිරිපත් කිරීම නිසා රු.1,392,871 ක වෙනසක් විය. | ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවන ලෙස කටයුතු කරන බව. | -එම- |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 104 | සභාව සතු ට්‍රැක්ටර් රථ දෙකක රු.233,600 ක් වටිනා හිච් සහ හුක් උපකරණ අස්ථාන ගත වීම සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි. | තීරණ පොතේ තීරණයක් සටහන් කරමින් වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 571 | 2012 වර්ෂයේ සිට පැවතෙන රු.10,777,309 ක් වටිනා පොදු තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සමග තැන්පත් ලේඛනය යාවත්කාලීන කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.33,099,357 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.33,203,875 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| (i) වරිපනම් හා බදු | 51,000 | 50,880 | 52,647 | 29,084 | 49,000 | 45,507 | 45,487 | 29,084 |
| (ii) කුලී | 4,875 | 2,125 | 5,060 | 2,176 | 4,814 | 1,963 | 4,332 | 3,846 |
| (iii)බලපත්‍ර ගාස්තු | 3,400 | 1,636 | 3,459 | 65 | 2,870 | 1,587 | 3,618 | 392 |
| (iv)වෙනත් ආදායම් | 30,424 | - | 74,221 | 235 | 55,619 | - | 51,141 | 289 |
| | 89,699 | 54,641 | 135,387 | 31,560 | 112,303 | 49,057 | 104,578 | 33,611 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් මෘත දේහයක් දහනය කිරීම සඳහා වැයවන සාමාන්‍ය ගෑස් ප්‍රමාණය පිළිබඳව දහන වාර්තාවක් සභාව විසින් ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් ලබාගෙන නොතිබුණි. | ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය දහන වාර්ථා ලබාදෙනුයේ ඔවුන් විසින් සකසන ලද ආදාහනාගාර වලට පමණක් බව දැන්වූ හෙයින් නගර සභා ආදාහනාගාරයට එම වාර්ථාව ලබා ගැනීමට නොහැක. ගබඩාවෙන් ආදාහනාගාරය වෙත ලැබෙන ගෑස් සිලින්ඩර ප්‍රමාණය හා සිදුකළ ආදාහනයන් ප්‍රමාණය පිළිබඳව ලේඛනයක් 2023.01.01 දින සිට පවත්වා ගෙන යන බව. | විධිමත් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ නිළධාරින් සඳහා අත්තිකාරම් සීමා හඳුනාගෙන අත්තිකාරම් ගිණුමක් පිළියෙළ කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට අත්තිකාරම් ගිණුම් සඳහා සීම හඳුනා ගෙන ගිණුම් වාර්ථා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් සීමා හඳුනාගැනීම කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 හා 2022 වර්ෂ තුළ අස්ථාන ගත වූ හා හානි වූ වත්කම් 04 ක් සම්බන්ධයෙන් දළ වශයෙන් සිදුවී ඇති එකතුව රු.95,150ක්වූ අලාභය වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට හා සුදුසු පරිදි ක්‍රියා මාර්ග ගැනීමට මූලික විමර්ශන වාර්තාවලින් නිර්දේශ ලබාදී තිබුණද විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 14 දින වන විටත් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කරන බව. | විමර්ශන පවත්වා අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගේට්ටු පියන් දෙකක් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් වූ රු.312,500ක අලාභය අයකර ගැනීමට ලබා දී තිබුණු නිර්දේශයට මුදල් කමිටුව එකඟ නොවීම මත විමර්ශනයක් සඳහා 2022 පෙබරවාරි 24 දින පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් මාස 10 ක පමණ කාලයක් ගත වී තිබුණද පරීක්ෂණයක් පැවත්වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවිය. | ඒ අනුව ගේට්ටු දෙකේ අලාභය වන රු.312,500ක මුදල ශ්‍රී ජයන්ති ප්‍රජා මණ්ඩලයෙන් අයකිරීමට කටයුතු කරන බව. | පරීක්ෂණ පවත්වා අලාභ අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) නොසැලකිලිමත් ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් සභාවේ JCB යන්ත්‍රයේ ඉන්ධන ටැංකියට සිදු වී තිබුණු හානිය යථා තත්වයට පත් කිරීමට වැයවුණු රු.300,888 ක මුදලින් රක්ෂණයෙන් ආවරණය නොවූ රු.77,742 ක මුදල 2022 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී තීරණ පොතේ තීරණයක් සටහන් කරමින් ඒ සඳහා වගකිවයුතු නිලධාරිගෙන් අයකර ගැනිමට කටයුතු කරන බව. | පරීක්ෂණ පවත්වා අලාභ අයකරගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෘත දේහ තැබීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ජාතික තරඟකාරී ලංසුකැඳවීම මත තෝරාගත් පෞද්ගලික සමාගමක් සමඟ 2022 මාර්තු 21 දින රු.119,126,456ක මුදලකට ගිවිසුම්ගතව තිබුණි. එසේම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.24,322,994ක් 2022 අප්‍රේල් 05 දින අදාල සමාගම වෙත ගෙවා තිබුණද 2023 අප්‍රේල් 26 දිනැති අංක 2022/03 දරන අයවැය චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ වැඩ නවතා තිබුණි . | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන දැන්වීම දෙවතාවක් භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරීමට සිදුවීමෙන් රු.195,021ක නිෂ්කාර්ය වියදමක් සහා අරමුදලින් වැය කර තිබුණි. | මුල් අවස්ථාවේ ප්‍රසම්පාදන දැන්වීම භාෂාත්‍රයෙන් පලකර ඇති අතර, එම දැන්වීමට සංශෝධනයක් සිදුකිරීමට සභාවට අවශ්‍යවීම හේතුවෙන් සංශෝධන දැන්වීමක් පළකිරීමට සිදුවූ බව. | සෑමවිටම ප්‍රසම්පාදන දැන්වීම් නිවැරදිව පල කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | යෝජිත ඉඩමේ පස් පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා රු 65,286.ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මුල් අවස්ථාවේ බිල්පත්‍රය රු.396,900ක් වූ අතර දෙවන අවස්ථාවේ බිල් පත්‍රය රු.462,186ක් විය. ඒ අනුව වැඩිපුර ගෙවීමක් කිරීමට සිදුවූ බව. | වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකරගැනීමට කටයුතු කළ යුතුය. |